ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය - **2019**

---

**1.** **මතය**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි සඳහන් නියමයන්ට අනුකූලව සකස් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති මුදල් හා මුදලට සමාන ශේෂයන්වල එකතුව රු.7,744,780 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි පෙන්නුම් කර තිබුණි. | 2019 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඊට පෙර වර්ෂවල සකස් කරන ලද ආකෘතියෙන් සකස් කර ඇති අතර 2020 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිති අංක 2 හි සඳහන් උපදෙස්වලට අනුව නිවැරදිව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුගතව සකස් කල යුතු වීම. |

**1.5.3** ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයිය මගින් ලැබිය යුතු සහභාගීත්ව මුදල සහ විගණන ගාස්තු වෙන්කිරීම් පිළිවෙලින් රු.270,000 බැගින් අඩුවෙන් දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා වගකීම් රු.270,000 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | සුපිරි වාසනා සම්පත ලොතරැයි අරමුදලේ ගිණුම් හා ලැබිය යුතු ලොතරැයි අරමුදල් ගිණුමේ 2019 වර්ෂය සඳහා ශේෂ සටහන් කිරීමේ දී, ලොතරැයි අරමුදල් ගිණුමේ 2019 වර්ෂයට ලැබිය යුතු අරමුදල් ප්‍රමාණය සහ ලැබිය යුතු අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය අතපසුවීමකින් වැරදි ලෙස සඳහන් වී තිබීම මේ සඳහා හේතු වී ඇත. | ගිණුම් නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතු වීම. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,551,252 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.,5,404,477 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.853,225 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සභාව වෙත වර්ෂය සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන රු.2,500,000 කින් සහ සුපිරි වාසනා සම්පත ලොතරැයිය මගින් ලැබී තිබූ සහභාගිත්වය රු.5,053,340 කින් අඩුවී තිබුණි. කෙසේ වුවද වර්ෂය තුල වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ලබාදී තිබූ රු.7,000,000 ක් වූ ප්‍රදානය නිසා එම පිරිහීම රු.853,225 දක්වා අඩුවී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම හා වියදම විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම | 2019 | 2018 | වැඩිවීම/අඩුවීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| රජයේ ප්‍රදාන | 40,500,000 | 43,000,000 | (2,500,000) | 5.8 |
| සුපිරි වාසනා සම්පත | 18,793,420 | 23,847,060 | (5,503,640) | 23.0 |
| **වියදම** | | | | |
| නිවාස ඉදිකිරීම | 16,223,309 | 18,742,761 | (2,519,452) | 13.4 |
| ආධාරක උපකරණ | 19,194,297 | 13,030,892 | 6,163,405 | 47.29 |
| ස්වයං රැකියා ආධාර | 7,899,866 | 10,053,057 | (2,153,191) | 21.4 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිවාස ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේ සුපිරි වාසනා සම්පත් ලොතරැයිය මගින් ලැබුණු මුදලට වඩා සියයට 23 ක් අඩුවීම හේතුවෙන් සමාලෝදිත වර්ෂයේ නිවාස ඉදිකිරීමේ වියදම සියයට 13 කින් අඩුවීමට හේතුවී තිබුණි.

(ආ) ස්වයං රැකියා ආධාර ඉල්ලුම් කිරීම ඉකුත් වර්ෂයට වඩා අඩුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම සියයට 21 කින් අඩු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2019** අයවැය යෝජනාවක් අනුව ආබාධ සහිත ප්‍රජාව සේවා නියුක්ති කිරීමේ අරමුණින් වැටුප් සහනාධාරයක් ලබාදීමට **2019** පෙබරවාරි **22** දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ශ්‍රී ලංකාවාසී සියළුම ආබාධ සහිත තැනැත්තන්ගේ සුදුසුකම්වලට ගැලපෙන පරිදි රැකියා සැපයීමේ ව්‍යාපෘතියක් සැළසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.**74,500,000** ක් පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි. ඒ අනුව ආබාධිත පුද්ගලයන් සේවයේ යොදවා ගනු ලබන්නේ නම් රු.**15,000** ක උපරිමයකට යටත්ව සේවකයාගේ වැටුපෙන් සියයට **50** ක වැටුප් සහනාධාරයක් මාස **24** ක් දක්වා ලබාදීමට යෝජනා වී තිබුණු අතර දිස්ත්‍රික්ක **25** ක ආබාධ සහිත පුද්ගලයන් **4965** ක් සඳහා මෙම ප්‍රතිපාදනය ලබාදීමට තීරණය කර තිබුණි. එසේ වුවත් ආබාධිත පුද්ගලයන්ගේ දත්ත රැස්කරගෙන මෙම සහනාධාරය ලබාදීමට නොහැකි වීම නිසා ඉහත ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවතිණි. | ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකියා සැපයීමේ වැඩසටහනක් සඳහා මෙම කාර්යාලයේ පූර්ව සූදානමක් හෝ දැනුවත් කිරීමකින් තොරව 2019 වර්ෂය සඳහා රු.මිලියන 74.5ක මුදලක් වෙන් කර තිබුණි. මෙම මුදල අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබුණි. කෙසේ වෙතත් **2019** වසරේ මූල්‍ය ප්‍රගතියක් අත් කර නොගත්ත ද, මාස හයක පමණ කෙටි කාලයක් තුළ සියලු සම්බන්ධීකරණ කටයුතු අවසන් කර **2020** වසරේ සිට මෙම පිරිස් රැකියාගත කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබේ | ආබාධ සහිත පුද්ගලයන් සේවා නියුක්ත කිරීමේ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු වීම. |
| (ආ) | ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා රු.**13,500,000** ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු අතර එහිදී සමස්ථ දිස්ත්‍රික්ක **25** ආවරණය කළ යුතු වුවද නියමු ව්‍යාපෘතියක් ලෙස නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරී වසම් **03** ක පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.**1,900,000** ක් පමණක් වැයකර තිබීම නිසා රු.**11,600,000** ක් ඉතිරි වී තිබුණි. | සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ක්ෂේත්‍ර ගණනාවක දත්ත රැස් කිරීමට අවශ්‍යවේ. ඒ සඳහා විශාල කාලයක් වැය වේ. එසේම, Voice නැමති රාජ්‍ය නොවන ආයතනයේ තාක්ෂණික හා ශ්‍රම දායකත්වය මත වැඩිදියුණු කරන ලද මෘදුකාංගයක් යොදා වසර අවසාන වන විට අදාළ මෘදුකාංගය ප්‍රතිනිර්මාණය කර, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 3ක් ආවරණය කරමින් අවම පිරිවැයකින් ඉතාම නිරවද්‍ය තොරතුරු ලබාගෙන ඇත. | ආබාධ සහිත පුද්ගලයන්ට සහන සැළසීමට ඔවුන් සඳහා දත්ත පද්ධතිය කඩිනමින් සකස් කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණ නිලධාරී, සංඥා භාෂා පරිවර්තක සහ බ්‍රේල් උපදේශක තනතුර ඇතුළු තනතුරු 16 ක් සඳහා නිලධාරීන් 40 ක් ස්ථිර කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට 2018 මාර්තු 19 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද 2020 දෙසැම්බර් 20 දින වන විටත් එම නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයට අනුයුක්ත කාර්යය මණ්ඩලය 24 දෙනෙකු මගින් සභාවේ කටයුතු ඉටුකරමින් පැවතිණි. | තාක්‍ෂණික නිලධාරියෙකු සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ඇති අතර, එය අනුමත කර බඳවා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | ආබාධිතයන් සඳහා සහන සැළසීමෙදී ඒ සම්බන්ධව කටයුතු කරන නිලධාරී මණ්ඩලයක් මහ ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ගත යුතුය. |
| (ආ) | ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම සම්බන්ධයෙන් අවශ්‍ය 2016 අංක 01 දරන ආබාධ තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ නියෝග යටතේ නීති ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රවේශ පහසුකම් සපුරාලීම පිළිබඳව පසුවිපරම් හා අධීක්ෂණ කටයුතු මෙන්ම ඒ සම්බන්ධ සියළුම කාර්යයන් හි වගකීම මෙම සභාව වෙත පැවරී තිබුණද, අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තාක්ෂණ නිලධාරීවරයෙක් මෙතෙක් බඳවා ගෙන නොමැති බැවින් එම කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ප්‍රවේශ පහසුකම් සැලසීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ එකඟතාවයකට පැමිණ ඇති අතර, ඊට අදාළ ඇස්තමේන්තු දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ලබා ගන්නා ලදී. | ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ පහසුකම් සහිතව වැඩි වැඩියෙන් අනාගත ඉදි කිරීම් සිදුකරන බවට සහතික වීම සභාවේ වගකීම වේ. |

## 5. අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළදී ජාතික සභාවේ ඉල්ලීම පරිදි වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 7ක් ආබාධිතයන්ට ඇස්කණ්නාඩි ලබාදීම සඳහා ජාතික සභාව වෙත ලබාදී තිබුණි. එම පරිත්‍යාග ඇතුළත් කර සංශෝධිත අයවැය ලේඛණයක් සකස් කර නොතිබුණි. | ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මඟින් 2019 වර්ෂය සඳහා රු.මිලියන 7 ක පරිත්‍යාගයක් ලැබිණි. එම මුදලින් කොටසක් උපකරණ මිලදී ගැනීම සඳහා 2020 වර්ෂයට ද යොදා ගත් බැවින් එම අයවැය වාර්තාව කඩිනමින් සකස් කර එවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සභාවේ අරමුදල් හා වියදම් දැරීම පිළිබඳව අයවැය ලේඛණයක් සකස් කළ යුතු අතර එයට විධිමත් පරිදි අවශ්‍ය සංශෝධනය කල යුතු වේ. |